(1) **පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ඇගේ ගම ගිංතොට ය. එය ගාලුපුරවරයට ඉතා ම කිට්ටු සුන්දර ගම්මානයකි. මල්, පලතුරු, ගහකොළවලින් පිරුණු නිරත ම සිසිල් සුළඟ මේ ගම ගැන අපූරු මතක සටහන් ඇයගේ සිහිනවල තිබිණි. හිමිදිරියේ ම අවදි වී ගේ අවට සිරියාව අත්විඳිමින් මේ පුංචි දැරිය ඒ අමුතු ම සිහින සිතින් මවා ගත්තා ය.

(i) ඇගේ සිහිනවල මතක සටහනේ තිබූ ගම ලියන්න.

.................................................................................................

(ii) ගේ අවට සිරියාව ඇය වින්දේ දවසේ කුමන කාලයේ ද?

.................................................................................................

(iii) ලස්සන යන පදයට සමානාර්ථ පදයක් ලියන්න.

.................................................................................................

(iv) ඡේදයේ සඳහන් ස්ත්‍රීලිංග ඒකවචන ක්‍රියා පදයක් ලියන්න.

.................................................................................................

(v) ඡේදයේ සඳහන් සඤ්ඤක අකුරක් යෙදුණු වචනයක් ලියන්න.

.................................................................................................

(vi) දරුවා යන්නට යෙදෙන ස්ත්‍රීලිංග පදය ලියන්න.

.................................................................................................

(2) **පහත කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

වෙරළ වටා මුතුපර වැටියයි - ඉන්දිය සයුරේ මුතු ඇටයයි
පාට පාට මැණික් ජාති - පසට යටින් කැටි වේ
රත්නදීප පොළොව තුළින් - ධන නිධාන මතු වේ

මහවැලි නිල්වලා ගඟයි - කළු වලවේ කැලණි ගඟයි
ගමින් ගමට ගලා ගොසින් - ගොඩයි මඩයි පොහොර කරයි



(i) වෙරළ වටා ඇත්තේ කුමක් ද?

.................................................................................................

(ii) පසට යටින් කැටි වී ඇත්තේ මොනවා ද?

.......................................................................................

(iii) මෙහි කියවෙන ගංගා දෙක මොනවා ද?

.......................................................................................

(iv) විරුද්ධාර්ථ ලෙස යෙදී ඇති යුගල පදයක් ඡේදයෙන් තෝරා ලියන්න.

.......................................................................................

(v) මහාප්‍රාණ අකුරක් යෙදුණු වචනයක් තෝරා ලියන්න.

.......................................................................................

(vi) එකතු වේ යන්නට ගීතයේ යෙදී ඇති පදය කුමක් ද?

.......................................................................................

(3) **පහත දැක්වෙන වාක්‍ය නිවැරදි කර නැවත ලියන්න.**

(i) මම උදෙන් ම අවදි වෙමු.

.......................................................................................

(ii) අපි හොඳින් ඉගෙන ගනිමි.

.......................................................................................

(iii) මම දත් මැද මුහුණ සේදුවෙමු.

.......................................................................................

(iv) අපි උදේ ආහාරය ගත්තෙමි.

.......................................................................................

(v) ගස සුළඟට වැනෙති.

.......................................................................................

(vi) රෑ අහසේ තරු බැබළෙති.

.......................................................................................

(vii) ගුරුතුමිය අපට ඉගැන්වුවේ ය.

.......................................................................................

(viii) වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කළා ය.

.......................................................................................

(ix) ජනතාව ජනාධිපති මන්දිරය වටලයි.

.......................................................................................

(x) ඈ ලස්සන ඇඳුමක් ඇන්දේ ය.

..........................................................................................

(xi) ඔහු විභාගයට පෙනී සිටියා ය.

..........................................................................................

(xii) ඔවුහු නාට්‍යයක් ඉදිරිපත් කළේ ය.

..........................................................................................

(4) **අසා ලියමු.**

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | ..................... | ________________ | (ii) | ..................... | ________________ |
| (iii) | ..................... | ________________ | (iv) | ..................... | ________________ |
| (v) | ..................... | ________________ | (vi) | ..................... | ________________ |
| (vii) | ..................... | ________________ | (viii) | ..................... | ________________ |
| (ix) | ..................... | ________________ | (x) | ..................... | ________________ |
| (xi) | ..................... | ________________ | (xii) | ..................... | ________________ |
| (xiii) | ..................... | ________________ | (xiv) | ..................... | ________________ |
| (xv) | ..................... | ________________ | (xvi) | ..................... | ________________ |
| (xvii) | ..................... | ________________ | (xviii) | ..................... | ________________ |
| (xix) | ..................... | ________________ | (xx) | ..................... | ________________ |

(5) **වර්ණ මාලාව ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| අ | ආ | ඇ | ඈ | ඉ | ඊ |
| උ | ඌ | ඍ | ඎ | ඏ | ඐ |
| එ | ඒ | ඓ | ඔ | ඕ | ඖ |
| අං | අඃ | | | | |
| ක | ඛ | ග | ඝ | ඞ | ඟ |
| ච | ඡ | ජ | ඣ | ඤ | ඦ |
| ට | ඨ | ඩ | ඪ | ණ | ඬ |
| ත | ථ | ද | ධ | න | ඳ |
| ප | ඵ | බ | භ | ම | ඹ |
| ය | ර | ල | ව | | |
| ශ | ෂ | ස | හ | ළ | ෆ |

(i) මෙහි සියලු ම මධ්‍ය අක්ෂර රවුම් කරන්න.

(ii) සියලු ම ආරෝහණ අක්ෂර යටින් ඉරක් අඳින්න.

(iii) සියලු ම අවරෝහණ අක්ෂර මත කතිර ලකුණ යොදන්න.

(iv) මෙහි ඇති මහාප්‍රාණ අක්ෂර ලියා දක්වන්න.

..........................................................................................................

(v) මෙහි ඇති සඤ්ඤක අක්ෂර ලියන්න.

..........................................................................................................

(6) **පහත වැකිවලට සුදුසු විරාම ලකුණු යොදන්න.**

(i) උඩ ම පේළියේ ගැහැනු පිරිමි මල් පලතුරු ගම් කියා ලියාගන්න

(ii) ඕක මං දැකලා තියෙන ඕනෑම පැන්සලක් වාගෙයි නේ කියා මුනුපුරා කීවා

(iii) මේ ගෙඩි අනුභව කළ අයට වහා ම වමනය කරවන්න ඒ අයට ඖෂධ ලබාදෙන්න නායක සිටුතුමා අණ කළේ ය

(iv) සීයේ සීයේ අදත් කතන්දරයක් කියන්නකෝ නංගී අයැද සිටියා ය

(v) ලොකු අම්මා තාත්තාගේ ලොකු අයියාගේ බිරිඳ ඇගේ මේ අහිංසක සිහිනවල සිටි වීරවරියයි



(7) **පෞද්ගලික ලිපියක ආකෘතියේ කොටස් නිවැරදිව නම් කරන්න.**

① .........................
② .........................
③ .........................
④ ....................
⑤ ............................................................
............................................................
............................................................
⑥ ....................

(8) **පහත ගීතය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

කොටු වැටිච්ච පුංචි සරම - ඇඳන් නටන මල්ලියා
ගෙදර නිතර දඹර කරන - පුංචි මල්ලියා
මගේ මල්ලියා - සුරතලා චණ්ඩියා //

සෙල්ලම් ගෙයක් මා විනෝදයෙන් සදයි
ඒවා කඩා පෙරළලා දමා දුවයි
සීනි බෝල කන්න සල්ලි ඉල්ලලා හඬයි
වසයි හරි දඟයි මල්ලියා හරි හොඳයි //



කොටු වැටිච්ච ..............

පාසල් ගොසින් බෑගයක් අතින් අරන්
ගල් කූරයක් අරන් ඇවිත් ළඟින් ඉඳන්
පුංචි ගීත පුංචි කමට කියයි ආදරෙන්
නටයි සන්තොසින් මල්ලියා රත්තරන් //

කොටු වැටිච්ච ..............

(i) මල්ලී ඇඳගෙන සිටින්නේ කුමක් ද? ................................................

(ii) සෙල්ලම් ගෙයක් සෑදුවිට මල්ලී කරන්නේ කුමක් ද?

..........................................................................................

(iii) මල්ලී සල්ලි ඉල්ලන්නේ කුමකට ද? .................................................

(iv) පුංචි ගීත ගයමින් මල්ලී කරන්නේ කුමක් ද? .....................................

(9) **'මම පැන්සලක් වෙමි' යන මාතෘකාව යටතේ නිවැරදි වැකි තුනක් ලියන්න.**

(i) ..........................................................................................

..........................................................................................

(ii) ..........................................................................................

..........................................................................................

(iii) ..........................................................................................

..........................................................................................

(10) **පහත කවියේ හිස්තැන් සම්පූර්ණ කරන්න.**

ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
.............................................................

(11) **පහත ඉඟිවැකිවල අදහස ලියන්න.**

(i) එක හුස්මට - ..............................................................................

..............................................................................................

(ii) අකුරක් නෑර - ............................................................................

..............................................................................................

(iii) අනූ නවයෙන් බේරුණා - ..............................................................

..............................................................................................

(12) **පහත අර්ථයන්ට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ඉදිරියෙන් ලියන්න.**

(i) අනුන් රවටන්නට ගොස් තමන් රැවටීම.

..............................................................................................

(ii) තීරණ ගැනීමේ දී බුද්ධිමත් ලෙස කටයුතු නොකර නුසුදුසු තීරණයක් ගැනීම.

..............................................................................................

(iii) විමසීමකින් තොරව යමක් කිරීම.

..............................................................................................

---


**දරුවෙකුට ලබාදිය හැකි හොඳ ම වත්කම අධ්‍යාපනයයි.**

**5 ශිෂ්‍යත්ව ඉස්කෝලේ** | **4 ශ්‍රේණිය 2023**



❖ **විෂය නිර්දේශ ආවරණ හා ප්‍රශ්නපත්‍ර පන්තිය**

**- සෑම සඳුදා/ බදාදා/ සිකුරාදා දිනක ම**

**සවස 5.00 - 7.00 දක්වා**

**ඔබේ දරුවාත් අද ම ලියාපදිංචි කරවන්න.**

**SARASAVI ONLINE SCHOOL - 077 42 55 968**

**ලංකාවෙන් ම දෙවැනියා ඇතුළු විශිෂ්ට ප්‍රතිඵල රැසකට**
**මග පෙන් වූ ගුරුවරයා**

**මොහාන් සර්**